**ගාලු උරුමය පදනම - 2020**

**-------------------------------**

## **01. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

### **1.1 මතය**

**-------**

ගාලු උරුමය පදනමේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව, සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ගාලු උරුමය පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### **1.2. මතය සඳහා පදනම**

**---------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### **1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**---------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය පදනම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ගාලු උරුමය පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වදරවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුනද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් දරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල පදනමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ගාලු උරුමය පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව පදනම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගණුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගණුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 නීති,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි අංක 756 | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත්කර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් කළ යුතු වුවද, ඊට අනුකූලව භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | 2020 මූල්‍ය වර්ෂය සඳහා කඩිනමින් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් පවත්වන ලෙසට වන ඉල්ලීම රේඛීය අමාත්‍යාංශ ලේකම් වෙත යොමුකර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 1994 අංක 07 දරන ගාලු උරුමය පදනම පනතේ II වන කොටසෙහි 12 (1) ඡේදය | පනතේ විධිවිධාන ප්‍රකාරව, පදනමේ කටයුතු සිදුකරගෙන යාම සඳහා අරමුදලක් ගොඩනගා නොතිබුණි. | අදහස් දක්වා නැත. | පදනමේ අරමුණුගත කාර්යයන් ඉටුකළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු.55,286 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,956,108 ක් විය. ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,900,822 ක් හෙවත් සියයට 98.6 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ ආකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගාලු කොටුවේ සඳු මුර අට්ටාලයේ පිහිටි පැරණි ලන්දේසි යුධ කාමරය සංරක්ෂණය කර ගාල්ලේ ඓතිහාසික උරුමය පිළිඹිබු කරන ප්‍රදර්ශන ගැලරියක් බවට පත් කිරීම සඳහා 2020 දෙසැම්බර් 31 දින වන විට රු. 11,760,121 ක් වියදම් කර තිබුණද, එම සඳු මුර අට්ටාලය ප්‍රදර්ශන ගැලරියක් බවට පත්කර නොතිබුණි. | නුදුරු අනාගයේදී විවෘත කිරීමට නියමිත බව දන්වා තිබුණි. | වැය කරන ලද මුදල නියමිත කාර්යයන්ට යොදවා ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගාලු උරුමය පදනමට අවශ්‍ය බලතල ලබා ගැනීමට හා පදනම සඳහා ආදායම් උත්පාදනය නංවාලීම යන අරමුණු සඳහා 1994 අංක 07 දරන ගාලු උරුමය පදනම පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඒ සඳහා 2015 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල සංදේශයක් පිළියෙල කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අදාළ සංශෝධනයක් සිදු කර නොතිබුණි. | පනත සංශෝධනයේ ඉදිරි කටයුතු කරගෙන යාම සඳහා ගාලු උරුමය පදනම විසින් දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයෙන් ගෙන්වා ගෙන ඇති අදාළ ලේඛන, නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වෙත යවා ඇති බව | පනත සංශෝධනය කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | විථි ලාම්පු සවි කිරීමේ පළමු අධියර වෙනුවෙන් රු.1,784,544 ක්ද, දෙවන අධියර වෙනුවෙන් රු.2,395,266 ක්ද ලෙස පදනම විසින් වියදම් දරා නගර සභාව පවරා දී තිබුණද, වැය වූ රු.4,179,810 ක මුදල විගණිත දිනය වූ 2021 දෙසැම්බර් 16 දින තෙක් විදුලි බල සමාගමෙන් ප්‍රතිපූර්ණය කරවා ගෙන නොතිබුණි. | කාලයක් තිස්සේ මෙම පැරණි පහන් අක්‍රීයව පැවතීම ලෝක උරුම ගාල්ල කොටුවේ ජීවත්වන ප්‍රජාවටත්, ගාල්ල කොටුව නැරඹීමට පැමිණෙන සංචාරකයින් ටත් දැඩි දුෂ්කර තත්ත්වයක් ඇති වීම නිසා ගාලු උරුමය පදනමේ කළමනාකරණ මණ්ඩල අනුමැතියට යටත්ව ගාලු උරුමය පදනමේ ප්‍රාග්ධන ව්‍යාපෘතියක් ලෙස එකී පැරණි විදුලි පහන් අලුත්වැඩියා කර නඩත්තුව සඳහා ගාලු මහා නගර සභාව වෙත භාර දෙන ලදි. | විදුලිය වෙනුවෙන් නොව විථි පහන් වෙනුවෙන් වියදම් ප්‍රතිපූර්ණයට විදුලි බල මණ්ඩලයෙන් අනුමැතිය ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | මෙම පැරණි පහන් පද්ධතිය ලංකා විදුලි පුද්ගලික සමාගමේ දේපොළක් නොවන බැවින් වියදම් ප්‍රතිපූර්ණය කිරීම අවශ්‍ය නොවන බව සඳහන් කිරීමට කැමැත්තෙමි. තවද මාර්ග විදුලිය ශ්‍රී ලංකාවේ නොමිලයේ ලබා දෙන සේවාවක් වන අතර ඒ සඳහා කිසිම ගාස්තුවක් අය නොකෙරෙන බවද සඳහන් කරන බව | |
| (ඇ) | 2020 ජනවාරි 01 දිනට පදනමේ ගබඩාව තුළ රු.698,497 ක වටිනා පොත් හා අත් පත්‍රිකා තොගයක් ඉතිරිව පැවැතියදි, වර්ෂය තුළ අවශ්‍යතාවය නොසලකා හැර රු.275,000 ක් වටිනා පොත් මිලදී ගෙන තිබුණි. මෙම නිසා 2020 දෙසැම්බර් 31 දින වන විට රු.954,634 ක ඉතිරි තොග ගබඩාව තුළ නිෂ්කාර්යව පැවතුණි. | රු.14,390 ක ආදායම් පොත් සහ අත්පත්‍රිකා යන අයිතම දෙකෙහි ම සංයුතියකින් සමන්විත බව<br><br>එමෙන්ම වර්ෂය තුළ මිලදී ගැනීම් රු.275,000 ක් සිදු කර තිබුනේ Heritage of the walled city ග්‍රන්ථ 1000ක් මිලදී ගැනීම සඳහා ය.<br><br>සමස්ථ අලෙවි කටයුතු වලින් රු.4,474 ක අලාභයක් ජනනය වීම සඳහා වටිනාකමින් වැඩි පොත් කිහිපයක් රාජකාරී කටයුතු වලදී පරිත්‍යාග ලෙස නිදහස් කිරීම හේතු වී ඇත.<br><br>වර්ෂ අවසාන තොග වටිනාකම රු.954,634 ක ශේෂයක් පෙන්නුම් කෙරෙනුයේ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙනි. | තොග තබා ගැනීමේදී රටේ පවතින කොවිඩ් 19 අවදානම් තත්ත්වය හා ද්‍රවශීලතාවය ගැන සලකා උපරිම කාරක ප්‍රාග්ධන තුලනයකින් කටයුතු කළ යුතුය. |
| (ඉ) | රු.7,126,837 ක් වැය කර ඉදිකර තිබූ කෲා වැසිකිළි පද්ධතිය සහ පල්ලිය විදීය, වැසිකිළි පද්ධතිය ආදායම උපයා ගැනීම සඳහා ගිවිසුමකින් තොරව මහ නගර සභාවට පවරා දී තිබුණි. එම නිසා පදනමට ලබා ගැනීමට තිබූ ආදායම් අහිමි වී තිබුණි. | ගාල්ල කොටුවට පැමිණෙන සංචාරකයින් සඳහා වැසිකිළි අවශ්‍යතාවය දැඩි වීමත් නිසා බාලදක්ෂ මාවතේ පැරණි වැසිකිළි පද්ධතිය ගලවා දමා ගාල්ල කොටුවට ගැළපෙන පරිදි පැරණි කෲා වැසිකිළි පද්ධතිය නවීන වැසිකිළි පද්ධතියක් ලෙස සංවර්ධනය කර එහි නඩත්තු කටයුතු සඳහා ගාල්ල මහා නගර සභාව වෙත භාර දෙනු ලැබීය. | කොටුව තුළ ආදායම් උත්පාදනය කිරීමේ හැකියාව පදනමට ඇති බැවින් ආදායම් උත්පාදනය කිරීම පිළිබඳ අවධානය යොමු කළ යුතුය. |
| (ඊ) | ගාලු උරුමය පදනම භාරයේ ඇති පල්ලිය වීදියේ පොලිස් නිල නිවාස ලෙස භාවිතා කළ ගොඩනැගිල්ලේ පිටුපස පිහිටි වැසිකිළි පද්ධතිය රු.1,966,306 ක් වැය කර අළුත්වැඩියාකර තිබුණද, විගණිත දිනය වූ 2021 අප්‍රේල් 06 දින වන විටත්, එම වැසිකිළි පද්ධතිය අගුළු දමා වසා තිබුණි. | පල්ලිය වීදියේ පැරණි පොලිස් නිල නිවාසය අසළ ඉදිකර, පොලිස් නිල නිවාස හිමියන් විසින් භාවිත කළ වැසිකිළි පද්ධතියද අලුත්වැඩියා කිරීමෙන් පසු නඩත්තුව සඳහා ගාල්ල මහා නගර සභාව වෙත භාර දෙන ලදි. | කොටුව තුළ ආදායම් උත්පාදනය කිරීමේ හැකියාව පදනමට ඇති බැවින් ආදායම් උත්පාදනය කිරීම පිළිබඳ අවධානය යොමු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | ඉදිරියේදී මෙම වත්කම් අප වත්කම් ලේඛනයෙන් ඉවත් කොට ගාල්ල මහා නගර සභාවේ වත්කම් තුළට ඇතුලු කිරීමේ හැකියාව සම්බන්ධයෙන් සාකච්ඡා කොට අවසන් එකඟතාවකට පැමිණෙන බව | |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රධාන විධායක නිලධාරී, පරිපාලන නිලධාරී යන තනතුරු, ව්‍යාපෘති සහකාර තනතුරු 02 ක් හා ආරක්ෂක නියාමක තනතුරු 02 ක පුරප්පාඩු පැවති නමුත්, එම පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු වී පැවති ව්‍යාපෘති සහකාර තනතුරු 02 සඳහා 2021.04.08 වන දින සිට අමාත්‍යාංශයෙන් සංවර්ධන නිලධාරීන් දෙදෙනෙකු අනුයුක්ත කර ඇති අතර, සියළුම බඳවාගැනීම් අත්හිටුවා ඇත. පරිපාලන නිලධාරී තනතුරේ "රාජකාරී ඉටු කිරීමේ පදනම" මත මෙම කාර්යාලයේ කළමනාකරණ සහකාර සේවයේ ජ්‍යෙෂ්ඨතම නිලධාරිනිය පත් කර ඇත. අමාත්‍යාංශයේ අනුමැතිය ලද පසුව ආරක්ෂක නියාමක තනතුරු 02 සඳහා ද බඳවා ගැනීම් කල හැකිය. ප්‍රධාන විධායක නිලධාරී/අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගැනීමට පෙර බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් සුදුසුකම් සංශෝධනය කල යුතුය. | පුරප්පාඩු විධිමත්ව පුරවා ගැනීමට කටයුතු කළ යුතුය. |